# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2446/37 – 2025 ජූලි මස 22 වැනි අඟහරුවාදා – 2025.07.22**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය - IR/COM/01/2022/129

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2025.04.26 දිනැති හා අංක 2433/38 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.04.10 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් 1. තංගල්ල, කඳුරු පොකුණ උතුර, “ පබා” හි පදිංචි කේ. එච්.චමින්ද මයා 2. තංගල්ල, කඳුරු පොකුණ, මුගුණගහවත්ත පදිංචි කේ. බී. ආර්. එස් . කුමුදු කුමාර මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් 1. කොළඹ 07. ධර්මපාල මාවත, 65/සී, චේම්බර්ස් කලම්බු හි පිහිටි පාම් පැරඩයිස් කබානාස් ලිමිටඩ් 2. තංගල්ල, ගොයම් බොක්ක හි පිහිටි පාම් පැරඩයිස් කබානාස් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 29/2025 හා 2025.06.24 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජූලි මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදීය.

යොමු අංකය: IR/COM/01/2022/129
නඩු අංකය: A/29/2025

1. කේ. එච්. චමින්ද මයා,
"පබා"
කඳුරුපොකුණ උතුර,
තංගල්ල.

2. කේ. බී. ආර්. එස්. කුමුදු කුමාර මයා,
මුගුණ ගහවත්ත,
කඳුරු පොකුණ.
තංගල්ල.

*පළමු පාර්ශ්වය*

සහ

1. පාම් පැරඩයිස් කබානාස් ලිමිටඩ්,
චේම්බර්ස් කළම්බු,
නො. 65/C.
ධර්මපාල මාවත,
කොළඹ 07.

2. පාම් පැරඩයිස් කබානාස් ලිමිටඩ්,
ගොයම් බොක්ක, තංගල්ල.

*දෙවන පාර්ශ්වය*

**ප්‍රදානය**

ඉහත පාර්ශ්වයන් අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ගරු කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවතින කරුණ වනුයේ;

" පාම් පැරඩයිස් කබානාස් ආයතනය 2020.11.18 වන දින තාවකාලිකව වසා දමා 2021.12.01 වන දින නැවත විවෘත කිරීමෙන් අනතුරුව එහි සේවය කළ කේ.එච්. චමින්ද මහතාට හා කේ. බී. ආර්. එස් කුමුදු කුමාර මහතාට නැවත රැකියාව ලබා නොදීම මගින් අසාධාරණයක් සිදුව තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහන කවරේද? යන්න පිළිබඳව වේ.

මෙම බේරුම්කරණය වර්ෂ 2025.05.15 වන දින ආරම්භ කරන ලද අවස්ථාවේදී දෙපාර්ශ්වයම ලිඛිත ප්‍රකාශයන් ඉදිරිපත් කර නොතිබු හෙයින් දෙපාර්ශ්වයේ පළමු විස්තර ප්‍රකාශ 2025.05.23 දින හෝ එදිනට පෙර කාර්යාලයට ගොනු කරන ලෙසත්, දෙපාර්ශ්වයේ පළමු වන විස්තර ප්‍රකාශයන්හි පිටපත් පාර්ශ්වයන් අතර හුවමාරු කරගෙන ප්‍රතිපිළිතුරු ප්‍රකාශ ගොනු කිරීමට හැකි වන පරිදි 2025.06.19 වන දිනට නැවත කැඳවීමට තීරණය කරන ලදී.

ඊට ප්‍රථම දෙපාර්ශ්වය අතර සමථයක් ඇතිකර ගැනීම සඳහා තිබෙන හැකියාව ගැනද සොයා බලන ලෙසට දෙපාර්ශ්වයෙන්ම ඉල්ලීමක්ද කරන ලදී. ඒ අනුව 2025.06.19 වන දින නැවත පාර්ශ්වයන් කැඳවූ අතර පළමු පාර්ශ්වය එහිදී කියා සිටියේ මෙම බේරුම්කරණ ඉල්ලීම සිදුකිරීමෙන් අනතුරුව බේරුම්කරණ ඉල්ලීම කැඳවීමට ප්‍රථම පළමු පාර්ශ්වය විසින් මාතර කම්කරු විනිශ්චය සභාවේ අයදුම්පතක් ගොනුකොට ඇති බවයි. එසේ හෙයින්, එහි පළමු පාර්ශ්වය වෙනුවෙන් මෙම බේරුම්කරණය පවත්වාගෙන යාමට පළමු පාර්ශ්වය මැදිහත් වුවද, පසුව පළමු පාර්ශ්වයේ පළමු ඉල්ලුම්කරු දෙවන පාර්ශ්ව ආයතනයෙන් ඉල්ලා අස්වී ඇති බවයි. එසේ හෙයින් මෙම නඩුව ඉදිරියට පවත්වාගෙන යාම සඳහා පළමු පාර්ශ්වයට අවශ්‍යතාවයක් නොවන බවත්, පළමු පාර්ශ්වයේ දෙවන ඉල්ලුම්කරු විසින් ගරු කම්කරු විනිශ්චය සභාවේ පවතින ඉල්ලුම් පත්‍රය පවත්වාගෙන යාමට අගතියක් නොවන පරිදි, මෙම බේරුම්කරණය ඉල්ලා අස්කර ගැනීමට එකඟතාවය පළ කරන බවයි. මෙම පළමු පාර්ශ්වයේ ඉල්ලීම සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වයේ විරුද්ධත්වයක් නොමැති බවත්, එලෙස මෙම බේරුම්කරණය සමථයකට පත්කර ගැනීමට දෙපාර්ශ්වයම එකඟවන බව දෙවන පාර්ශ්වය ද දන්වා සිටින ලදී. තවද දෙවන පාර්ශ්ව ආයතනය විසින් පළමු පාර්ශ්වයේ පළමු ඉල්ලුම්කරු වන කේ. එච් වමින්ද මහතා විසින් 2025.05.10 වැනි දිනැතිව එම ආයතනයේ සේවයෙන් ඉල්ලා අස්වන බවට ලබා දී තිබූ ලිපියෙහි සහතික කළ පිටපතක්ද බේරුම්කරණය වෙත ඉදිරිපත් කර තිබුණි. එම ලිපියද සැලකිල්ලට ගෙන දෙපාර්ශ්වයේ එකඟතාවය මත මෙම ආරාවුල සම්බන්ධ බේරුම්කරණය මෙසේ අවසන් කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බවට මම සහතික කරමි.

**නීතිඥ සී. ඒ. එච්. එම්. විජේරත්න**
බේරුම්කරු.

2025 ජුනි මස 24 වැනි දින,
බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදීය.

EOG 07- 0283

---

මගේ අංක - IR/13/01/2007

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2015.07.22 දිනැති හා අංක 1924/31 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2015.07.15 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් ගාල්ල, හිරිඹුර පාර, අංක 598/ බී හි පදිංචි එම්. කේ. එස්. එම්. ඩයස් මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් ගාල්ල, පහළ ඩික්සන් පාර, අංක 19 හි පිහිටි දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 3609 හා 2025.05.09 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජූලි මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දීය.

එම්. කේ. එස්. එම්. ඩයස් මයා,
අංක 598/ බී,
හිරිඹුර පාර,
ගාල්ල.

නඩු අංකය: A/3609
IR/13/01/2007

එදිරිව

"දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය",
නො.19,
පහළ ඩික්සන් පාර,
ගාල්ල.

කම්කරු අමාත්‍ය එස්. බී. නාවින්න මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කර එය මා වෙත යොමු කර ඇත.

කම්කරු කොමසාරිස් ජනරාල් විසින් මා වෙත යොමු කරන ලද ආරාවුල වනාහී,

" දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සේවය කරනු ලබන එම්. කේ. එස්. එම්. ඩයස් මහතා එම අධිකාරියේ බඳවා ගැනීමේ පටිපාටිය අනුව 1990.06.01 දින සිට 5 (II) කාර්මික නිළධාරී තනතුර හා 1992.06.01 දින සිට 5(I) කාර්මික නිළධාරී තනතුර ද 1997.06.01 දින සිට 4 ශ්‍රේණියේ ඉංජිනේරු ශ්‍රේණියද එසේම ඊට පසු කාලයන්ට අදාලව ද ඉංජිනේරු සේවයේ ඉහළ ශ්‍රේණීන්ද සියලු හිඟ වැටුප් සමඟ ඉල්ලා සිටීම යුක්ති සහගතද? එසේ යුක්ති සහගත වන්නේ නම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ."

**ප්‍රදානය**

මේ අනුව 1969 (සංශෝධිත) කාර්මික ආරාවුල් පනතේ නියෝග සංග්‍රහයේ 21 (1) නියෝගයේ ප්‍රකාර ඉල්ලුම්කරු තම ස්ථාවරය 2015.08.19 දින යටතේ ගරු බේරුම්කරණ අධිකරණයට ගොනු කරමින් සැළකර ඇත.

ඉල්ලුම්කරු පළමුව මධ්‍යම රජය යටතේ ඇති මාර්ග සංවර්ධන අධිකාරියේ අනියම් කාර්මික නිලධාරියෙකු ලෙස 1987.05.04 දින සිට වසරක ස්ථිර කාල ගිවිසුමකට යටත්ව සේවය කර ඇත. එකී ගිවිසුම 1988.05.04 දින සිට තවත් මාස 6 කින් දීර්ඝ කළ බවත්, අනතුරුව 1988.06.01 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලුම්කරුට මාර්ග සංවර්ධන අධිකාරියේ 09 ශ්‍රේණියේ ස්ථිර පත්වීමක් ලැබුණු බවත් ඉන් අනතුරුව 1988 වර්ෂයේ දී වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභා නිර්දේශය මත හා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද වැටුප් සංශෝධනය අනුව 1988.06.01 දින සිට 06 වන ශ්‍රේණියේ කාර්මික නිළධාරී තනතුරට පත් වූ බවත් එසේ සේවය කරමින් සිටියදී 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පිහිටුවනු ලැබූ පළාත් සභාවලට පැවරුණු කාර්යයන් ඉටු කිරීම සඳහා එවකට මධ්‍යම රජය යටතේ සේවය කළ රාජ්‍ය නිලධරයන් පළාත් සභා වලට සේවයට යොමු කරලීම වෙනුවෙන් අංක 56/89 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව 1990.01.01 දින සිට දකුණු පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කළ බවත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 56/89 හි සඳහන් නියමයන් ඉල්ලුම්කරුට අදාළ වන බවත්, ඒ අනුව මධ්‍යම රජයේ සේවකයන් පළාත් සභා සේවයට අන්තර්ග්‍රහණය කළ යුතු වන්නේ ඔවුන් එවකට මධ්‍යම රජය යටතේ ඇති ආයතන තුළ අවසන් වරට දැරූ තනතුර හා ශ්‍රේණි නොවෙනස්ව තබා ගැනීමේ පමණක් වූ කොන්දේසි ඇතුළත්ව තිබූ බවත්, ඉන් අනතුරුව දකුණු පළාත් සභාව විසින් කෙටුම්පත් කරන ලද 1992 අංක 4 දරන ප්‍රඥප්තියක් මගින් මෙම වගඋත්තරකාර අධිකාරීය ස්ථාපිත වූ බවත්, ඒ වන විට මාර්ග සංවර්ධන අධිකාරියෙන් දකුණු පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කර සිටි සේවකයින් ඔවුන් මාර්ග සංවර්ධන අධිකාරිය තුළදී අවසන් වරට දැරූ තනතුරේ වැටුප් පියවර

හා වැටුප් පරිමාණයට අනුව 1993.02.01 දින සිට වගඋත්තරකාර අධිකාරියට අනුයුක්ත කරගත් පදනම මත ඉල්ලුම්කරුද මාර්ග සංවර්ධන අධිකාරියේදී අවසන් වරට දැරූ කාර්මික නිලධාරී 06 ශ්‍රේණියට වගඋත්තරකරු අනුයුක්ත කරගත් බවත්, එය සිදුවූයේ 56/89 චක්‍රලේඛයේ නියමයන්ට අනුව බවත් තහවුරු කර ඇත.

ඊට අමතරව වගඋත්තරකාර අධිකාරියේ 2003 වසරේ බලාත්මක වූ බඳවා ගැනීමේ පටිපාටියට අනුව කාර්මික නිලධාරී 06 ශ්‍රේණියේ වසර 2 ක සේවා කාලයක් ඇති අය කාර්මික නිලධාරී 5 (ii) ශ්‍රේණියටද, කාර්මික නිළධාරී 5 (ii) ශ්‍රේණියේ වසර 02 ක සේවා කාලයක් ඇති අය කාර්මික නිලධාරී 5 (i) ශ්‍රේණියටද උසස් කළ යුතුව තිබූ නෛතික පදනම මත කාර්මික නිලධාරී 5(i) ශ්‍රේණියේ වසර 5 ක සේවා කාලයක් ඇති අය ඉංජිනේරු 4 ශ්‍රේණියටද, ඉංජිනේරු 4 ශ්‍රේණියේ වසර 4 ක සේවා කාලයකින් පසු ඉංජිනේරු 3 ශ්‍රේණියටද, ඉංජිනේරු 3 ශ්‍රේණියේ වසර 6 ක සේවා කාලයකින් පසු ඉංජිනේරු 2(ii) ශ්‍රේණියටද ලබා ගත හැකි බවට බඳවා ගැනීම් පටිපාටියට සාක්ෂි දරන බවත් ඒ අනුව ඉල්ලුම්කරු කාර්මික නිලධාරී 06 ශ්‍රේණියේ වසර 2 ක සේවා කාලය 1990.06.01 දින සම්පූර්ණ වන බැවින් කාර්මික නිළධාරී 5 (ii) ශ්‍රේණිය ද, එම ශ්‍රේණියේ වසර 2 ක සේවා කාලය මත කාර්මික නිළධාරී 5 (i) ශ්‍රේණිය 1992.06.01 දින සිටද, එම ශ්‍රේණියේ වසර 5 ක සේවා කාලය 1997.06.01 දින සම්පූර්ණ වන තත්ත්වය මත ඉංජිනේරු 4 වන ශ්‍රේණියද, ඉංජිනේරු 4 වන ශ්‍රේණියේ වසර 4 ක සේවා කාලය 2001.06.01 දිනට සම්පූර්ණ වන බැවින් එදින සිට ඉල්ලුම්කරුට ඉංජිනේරු 3 ශ්‍රේණිය ද, ඉංජිනේරු 3 ශ්‍රේණියේ වසර 6 ක් සම්පූර්ණ වන 2007.06.01 වන දින සිට ඉංජිනේරු 2 (ii) ශ්‍රේණිය ද ලැබිය යුතු බවට මා නිගමනය කරමි.

ගරු අධිකරණයට 4 (1) වගන්තිය යටතේ සමථ කර බේරුම් කිරීම සඳහා යොමු කර ඇති ආරාවුල වනුයේ ඉල්ලුම්කරුට ඒ ඒ දින වලදී ලැබිය යුතු උසස්වීම් නොලැබීම යන්නය. ඒ අනුව සලකා බැලිය යුතු වන්නේ එකී ඉල්ලීම වගඋත්තරකරුගේ බඳවා ගැනීම් පටිපාටියට අනුගත ආරාවුලක් බැවින් එකී බඳවා ගැනීම් පටිපාටියට අනුව ඉල්ලුම්කරු ඉල්ලා සිටි උසස්වීම් ලබා නොදී එකී බඳවා ගැනීම් පටිපාටියට පටහැනිව වගඋත්තරකරු ක්‍රියා කරමින් ඉල්ලුම්කරුට අසාධාරණයක් කර තිබේද යන්න ගැනය.

මේ අනුව ඉල්ලුම්කරුගේ ස්ථාවරය තහවුරු කිරීම සඳහා වගඋත්තරකරුගේ බඳවා ගැනීම් පටිපාටියේ ඒ ඒ තනතුරු හා ශ්‍රේණි වලට අනුකූල වන කොටස් A15 සිට A19 දක්වා වූ ලේඛන මගින් මෙසේ තහවුරු කර ඇත.

(අ) කාර්මික නිළධාරී V-ii ශ්‍රේණියට අදාළව A15 සහ 15(a)A 15(b) ලෙසද

(ආ) කාර්මික නිලධාරී V-i ශ්‍රේණියට අදාළව A16 සහ A16(a)A 16(b) ලෙසද

(ඇ) ඉංජිනේරු IV ශ්‍රේණියට අදාළව A17 සහ 17(a) ලෙසද

(ඈ) ඉංජිනේරු III ශ්‍රේණියට අදාළව A18 සහ A18(a) ලෙසද

(ඉ) ඉංජිනේරු 02 (ii) ශ්‍රේණියට අදාළව A19 ලෙස ද ගොනු කර ඇති ලේඛන වලට මාගේ අවධානය යොමු කරන ලදී.

ඉහත ලේඛන වගඋත්තරකරුගේම බඳවා ගැනීම් පටිපාටි බැවින් මෙකී ලේඛනවල අන්තර්ගතය වගඋත්තරකරු හඹ කර නැත.

වගඋත්තරකරු විසින් නියෝග සංග්‍රහයේ 21 (1) නියෝගයට අනුගතව 2018.03.02 දින යටතේ ගරු අධිකරණයට ගොනු කරන ලද පළමු ප්‍රකාශය මගින් ප්‍රකාශ කර ඇත්තේ බඳවා ගැනීම් පටිපාටියට අනුව 1990.06.01 වන දින සිට 05 (ii) කාර්මික නිලධාරි තනතුරද, 1992.06.01 දින සිට 05 (i) කාර්මික නිලධාරී තනතුරද, 1997.06.01 සිට 4 ශ්‍රේණියේ ඉංජිනේරු තනතුරද, එසේම ඊට පසු කාලයන්ට අදාළව ඉංජිනේරු සේවයේ ඉහළ ශ්‍රේණියේ ඉංජිනේරු තනතුරද, එසේම ඊට පසු කාලයන්ට අදාළව ඉංජිනේරු සේවයේ ඉහළ ශ්‍රේණියන්ද සියළු හිඟ වැටුප් සහිතව ඉල්ලා සිටීමට කිසිදු පදනමක් නොමැති බවත්. ඊට හේතු වශයෙන් වග උත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ ඉල්ලුම්කරු මාර්ග සංවර්ධන අධිකාරියේ අනියම් කාර්මික නිලධාරියෙකු ලෙස 1987.05.04 දින සිට 1988.05.03 දින දක්වාද, 1988.11.03 දින දක්වා මාස 06 කාළ සීමාවකට දීර්ඝ කර ඇති අතර, ජාතික ආධුනිකත්ව මණ්ඩලය මගින් පිරිනමන ලද 1988.04.14 දින විශේෂ ආධුනිකත්ව ජාතික සහතිකය මත 1988.06.01 දින සිට මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්මික නිළධාරී ස්ථිර තනතුරට පත්ව ඇති අතර, 1989.04.25 දින ලිපිය මගින් 1988.06.01 දින සිට බල පැවැත්වෙන පරිදි කාර්මික නිළධාරී 06 ශ්‍රේණියට අදාළ සංශෝධිත වැටුප් තලයෙහි පිහිටුවා ඇති බවත්,

ඉන් අනතුරුව මෙම ඉල්ලුම්කරු 1990.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි දකුණු පළාත් රාජ්‍ය සේවයේ මධ්‍යම මට්ටමේ කාර්මික නිලධාරී iiA තනතුරට පත්ව තිබියදී එම තනතුර භාරගෙන තිබියදී 1990.06.01 දින සිට 05 (ii) කාර්මික නිලධාරී තනතුරට පත් විය යුතු බවට කරන ඉල්ලීම ප්‍රතිබන්ධනය වන බවත්, ඊට අමතරව 1993.02.01 දින සිට ඉල්ලුම්කරුව කාර්මික නිළධාරී 06 ශ්‍රේණියෙහි පිහිටුවා ඇති බැවින් කාර්මික නිළධාරී 05 (ii) ශ්‍රේණිය ඉල්ලා සිටීමද ප්‍රතිබන්ධනය වන බවය.

මෙම වගඋත්තරකරුගේ සාමාන්‍යාධිකාරිවරයා “ප්‍රතිබන්ධනය” යන වචනයේ අර්ථ නිරූපණය වැරදි සහගත ලෙස හුවා දක්වා ඇත. මෙම ඉල්ලුම්කරු මෙම වගඋත්තරකාර ආයතනයට අනුයුක්ත වනුයේ ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ සිටියදී මධ්‍යම රජය ගත් ප්‍රතිපත්තිමය තීරණයක් මත හා පළාත් සභා ඇති කිරීමෙන් පසු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 56/89 හි කොන්දේසි ප්‍රකාර රජය යටතේ අවසන් වරට සිටි තනතුරේම පිහිටුවිය යුතු අතර, මෙම වගඋත්තරකරු ඉල්ලුම්කරුව 1993.02.01 වන දින අනුයුක්තකර ගැනීමේදී හෝ 1990.01.01 සිට දකුණු පළාත් රාජ්‍ය සේවයට කාර්මික සේවයේ (ii) A තනතුරට අනුයුක්ත කර ගැනීමේදී අදාළ ආයතනවල බලාත්මක බඳවා ගැනීම් හා උසස් කිරීමේ පටිපාටිවලට අනුකූලව ඉල්ලුම්කරුගේ සුදුසුකම් මත උසස්වීම් ඉල්ලා නොසිටින බවට කිසිදු කොන්දේසියකට ඉල්ලුම්කරු යටත් වී නැත.

ඒ අනුව ඉල්ලුම්කරුගේ ඉල්ලීම ප්‍රතිබන්ධනය වූයේ කෙසේද යන්න වගඋත්තරකරුගේ ප්‍රකාශය පදනම් රහිත වන අතර, රටේ ඕනෑම පුරවැසියෙකුට ඒ ඒ ආයතන වල බඳවා ගැනීමේ පටිපාටි වල සඳහන් සුදුසුකම් මත ඒ ඒ තනතුර ඉල්ලා සිටීමේ අයිතිය මූලික අයිතිවාසිකමක් බව මම අවධාරණය කරමි.

වගඋත්තරකරු තමාගේ පළමු ප්‍රකාශන මගින් එවැනි ස්ථාවරයක් ගෙන තිබුනත් වගඋත්තරකරු විසින් නියෝග සංග්‍රහයේ 21 (2) නියෝගයේ ප්‍රකාර 2018.04.27 දින තම දෙවන ප්‍රකාශය ගරු අධිකරණයට ගොනු කරමින් මෙසේ ප්‍රකාශ කර ඇත. ඉල්ලුම්කරුගේ පළමු ප්‍රකාශයේ නැතහොත් ඉල්ලුම්පතෙහි 01 සිට 08 දක්වා ඡේදයන්හි සඳහන් කරුණු මෙම වගඋත්තරකරු පිළිගෙන ඇත.

උත්තරවාද ප්‍රති උත්තරවාද වලින් අනතුරුව ඉල්ලුම්කරු A1 සිට A37 දක්වා ලේඛන ලකුණු කරමින් තම මූලික සාක්ෂිය ඉදිරිපත් කරමින් මා වෙත 4(1) වගන්තිය යටතේ ගොනු වී ඇති ආරාවුලට අදාළව ඉල්ලුම්කරුට ලැබිය යුතු උසස්වීම් ලැබිය යුතු දින වකවානු හා ලැබිය යුතු තනතුරු හා ශ්‍රේණි වලට අදාළව බඳවා ගැනීම් පටිපාටි A15 සිට A19 දක්වා වූ ලේඛන ගොනු කරමින් ඉල්ලුම්කරුගේ ස්ථාවරය තහවුරු කර ඇත.

වගඋත්තරකරුගේ උගත් නීතිඥ මහතා ඉල්ලුම්කරුගෙන් දීර්ඝ ලෙස හරස් ප්‍රශ්න අසමින් උත්සාහ කරන ලද්දේ ඉල්ලුම්කරු මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ 1987.05.04 වන දින සිට අනියම් කාර්මික නිළධාරී පත්වීම් ලබාගෙන ඇත්තේ මූලික සුදුසුකම් සපුරා නොතිබියදී අයථා විදියට බවත්, ඊට හේතු වශයෙන් වගඋත්තරකරු ඉල්ලුම්කරුට ජාතික ආධුනිකත්ව මණ්ඩලය මගින් පිරිනමන ලද විශේෂ ආධුනිකත්ව ජාතික සහතිකය ලැබී ඇත්තේ 1988.04.11 වන දින බවට යන්නය. මෙම තත්ත්වය වගඋත්තරකරුගේ නීතිඥ මහතා විසින් දිගින් දිගටම උඩු යටිකුරු කරමින් ඉල්ලුම්කරුගෙන් දීර්ඝ ලෙස හරස් ප්‍රශ්න අසන ලදී. නමුත් වගඋත්තරකාර පාර්ශ්වයෙන් එසේ ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න අසා ඇත. නමුත් වගඋත්තරකාර පාර්ශ්වය එසේ ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න අසා ඇත්තේ නියෝග සංග්‍රහයේ 21(2) නියෝගයේ ප්‍රකාර තම දෙවන ප්‍රකාශය ගොනු කරමින් ඉල්ලුම්කරුගේ පළමු ප්‍රකාශයේ කරුණු අංක 1 සිට 8 දක්වා වූ කරුණු පිළිගෙන තිබෙන පසුබිමකදීය. ඒ අනුව වගඋත්තරකාර පාර්ශ්වය විසින් ගරු අධිකරණයට සත්‍ය කරුණු ඉදිරිපත් කරමින් සහාය දක්වනවා වෙනුවට ඉල්ලුම්කරුව මානසික පීඩාවකට ලක් කරමින් වගඋත්තරකරු විසින්ම පිළිගෙන ඇති කරුණු ඉල්ලුම්කරු නොමඟ යවමින් හරස් ප්‍රශ්න අසා ඇති තත්ත්වය විශ්ලේෂණාත්මකව විශ්ලේෂණය කිරීමේදී වගඋත්තරකරුගේ ස්ථාවරය ප්‍රතිබන්ධනය කරගෙන ඇත.

ඇත්ත වශයෙන් මෙම ආරාවුල වගඋත්තරකරුගේ බඳවා ගැනීම් පටිපාටියට සීමා වූ ආරාවුලකි. ඒ අනුව එහි බඳවා ගැනීම් පටිපාටියට අනුව ඒ ඒ තනතුරු හා ශ්‍රේණීන් ලබා ගැනීමේ අයිතිය ඇති බවට තහවුරු කිරීම ඉල්ලුම්කරුගේ වගකීම වන අතර වගඋත්තරකරුගේ වගකීම වන්නේ ඉල්ලුම්කරුගේ බඳවා ගැනීම් පටිපාටියට අනුව ඉල්ලුම්කරුට සුදුසුකම් නොමැති බැවින් ඒ ඒ දින වකවානු වලදී උසස්වීම් ලබා නුදුන් බැව් තහවුරු කිරීම වේ.

එම තත්ත්වය යටතේ මෙම නඩුවේ ඉල්ලුම්කරු මුල් අවස්ථාවේ සිටම ගත් ස්ථාවරය වන බඳවා ගැනීම් පටිපාටියට අනුව ඉල්ලුම්කරුට සුදුසුකම් තිබියදී ඒ ඒ වකවානු වලදී හිමිවිය යුතු ශ්‍රේණිගත උසස්වීම් හා තනතුරු ලබා නොදීමෙන් තමාට වගඋත්තරකරු අසාධාරණයක් සිදුකර ඇති බවට සත්‍යතා වැඩිබර සාක්ෂි මගින් තහවුරු කර ඇත.

අනතුරුව වගඋත්තරකරු තමාගේ නඩුව ආරම්භ කරමින් වගඋත්තරකරුගේ සාක්ෂිකරු වශයෙන් පුෂ්පා පත්මිණි වික්‍රමසිංහ විතාන මහත්මිය ඉල්ලුම්කරුගේ මූලික සාක්ෂිය 2022.02.02 දින ගරු අධිකරණයට XI ලේඛනය සමඟ ගොනු කරන ලදී.

මෙම සාක්ෂිකාරිය තම දිවුරුම් ප්‍රකාශයේ ඡේද අංක 3 සහ 4 යටතේ කියන්නේ මෙම ඉල්ලුම්කරුට ඉහත ඉල්ලීම් යුක්ති සහගත නොවන බවත්, එහි ඡේද 4A, 4B,5 සහ 6 මගින් කියන්නේ මූලික සුදුසුකම් සපුරා නොතිබියදී A1 දරන පත්වීම් වංචා සහගතව ලබා ගෙන ඇති බවත්, මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ එකී පත්වීම මාස 06 කින් දීර්ඝ කර ගැනීම වංචා සහගත බවත් යන්නය.

මූලික සාක්ෂි ඡේද අංක 9 යටතේ කියන්නේ 6 වන ශ්‍රේණියේ කාර්මික නිළධාරී තනතුර සඳහා A14C අනුව 7 වන ශ්‍රේණියේ කාර්මික නිලධාරී තනතුරේ වසර 7 ක් සේවය කළ යුතු බවට ඉල්ලුම්කරු පිළිගෙන ඇති බවය.

A14 මගින් වගඋත්තරකරු අනුගමනය කළ පෙර බඳවා ගැනීම් පටිපාටිය හඳුන්වා දී ඇති අතර, ඉල්ලුම්කරු මෙම වගඋත්තරකාර අධිකාරියට අනුයුක්ත වන්නේද ඉල්ලුම්කරු මධ්‍යම රජය යටතේ දැරූ කාර්මික නිළධාරී 06 වන ශ්‍රේණියටම වන අතර එය වගඋත්තරකරු තම මූලික ප්‍රකාශයේදී පිළිගෙන තිබෙන පසුබිමක මෙම සාක්ෂිකාරිය ද ගරු අධිකරණය නොමඟ යැවීම සඳහා සාවද්‍ය ප්‍රකාශ කර ඇති තත්ත්වය ගරු අධිකරණයේ අවධානයට යොමු කර සිටී.

ඊට අමතරව වගඋත්තරකරුගෙන් සාක්ෂිකාරිය දිවුරුම් ප්‍රකාශය සමඟ ගොනු කරන ලද X1 දරන ලේඛනය සම්බන්ධයෙන් දිවුරුම් ප්‍රකාශයේ ඡේද අංක 16 න් කියා ඇත්තේ එහි 2000.04.27 දින ලේඛනය වගඋත්තරකරුගේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් ඉල්ලුම්කරුට යවා ඇති ලේඛනයක් බවය.

රජයේ පාසැල් වල 5 ශ්‍රේණියේදී සිංහල භාෂාව විෂයට අදාළව රාජකාරී ලිපි / පුද්ගලික ලිපි ලිවීම උගන්වනු ලබන අතර, එහිදී ලිපිය ලියන්නා සහ ලිපිය ලබාගන්නාගේ ලිපිනයන් හා දිනය සටහන් කිරීම උගන්වන අතර, ලිපියේ වම් අත ලිපිය ලබන්නාද, දකුණු අත ලිපිය ලියන්නාද, රාජකාරී ලිපියක් නම් පිටපත් වශයෙන් ලියා ඒ අයගේ නම් සහ තනතුරු ද ලිවිය යුතු පාඩම මෙම සාක්ෂිකාරිය වන සාමාන්‍යාධිකාරීවරිය ඉගෙන ගෙන නැද්ද? නොඑසේ නම් ගරු අධිකරණය නොමඟ යැවීමට X1 ලේඛනය උපයෝගී කරගත්තාද යන්න නිරීක්ෂණය කළ යුතුව ඇත. ඒ අනුව X1 ලිපිය වගඋත්තරකරුගේ නියෝජ්‍ය සාමානාධිකාරීවරයා සාමාන්‍යාධිකාරී දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට යොමු කළ ලිපියක් වන අතර, අවම වශයෙන් එම ලිපියේ පිටපතක් හෝ ඉල්ලුම්කරුට යොමු නොකිරීමෙන් තහවුරු වන්නේ මෙම දිවුරුම් ප්‍රකාශය මගින් සාවද්‍ය ප්‍රකාශයක් කර ඇති බවත් ඒ අනුව X1 ලේඛනය කූට ලේඛනයක් බවට නීතිය ඉදිරියේ පිළිගත යුතුව ඇති බවය.

මේ අනුව සලකා බැලිය යුතු වන්නේ දිවුරුම් ප්‍රකාශයක පවත්නා නීතිමය තත්ත්වය හා උපරිමාධිකරණ නඩු තීන්දු ප්‍රකාර සත්‍ය ප්‍රකාශ කරන බවට දිවුරුම් ප්‍රකාශයක් මගින් ප්‍රතිඥා දී කරන ප්‍රකාශයක සාවද්‍ය ප්‍රකාශ කිරීම දණ්ඩ නීති සංග්‍රහය පනතේ දඬුවම් ලැබිය යුතු බරපතල වරදක් වන්නේද යන්නය. එම තත්ත්වය මෙම සාක්ෂිකාරීය දැනුවත් ද යන්නත් සලකා බැලීමේදී මෙම සාක්ෂිකාරිය ඉල්ලුම්කරුගේ හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් මෙසේ තහවුරු කර ඇත.

ප්‍ර : ඔබ දන්නවාද දිවුරුම් ප්‍රකාශයක් මගින් ගරු අධිකරණයට ඉදිරිපත් කළ යුත්තේ සත්‍යය හා නිවැරදි කරුණු බව?

පි : ඔව්

ප්‍ර : ඒ අනුව අසත්‍ය කරුණු ඉදිරිපත් කොට ගරු අධිකරණය නොමඟ යැවීම නීතියෙන් දඬුවම් ලැබිය හැකි වරදක් බව පිළිගන්නවාද?

පි : පිළිගන්නවා (උපුටා ගැනීම 2022.03.22 පිටුව 4)

ඊට අමතරව මෙම සාක්ෂිකාරිය ඉල්ලුම්කරුගේ වැඩිදුර හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් ඉල්ලුම්කරුගේ දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කරුණු අසත්‍ය බවට මෙසේ තහවුරු කර ඇත

ප්‍ර : ඉල්ලුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව 5(ii) කාර්මික නිලධාරී තනතුරට පත් කර තිබෙන්නේ කවදාද?

පි : 2000.04.12 වන දින

ප්‍ර : ඒක ස්ථිරයි නේද?

පි : පිළිතුරක් නොදෙයි

ප්‍ර : මෙම ඉල්ලුම්කරු ඩයස් මහත්මයාව කාර්මික නිළධාරි 5 (ii) ශ්‍රේණියට කවදාද පත් කලේ?

පි : 2004.04.28

ප්‍ර : එය ස්ථිරද?

පි : ඔව්

ප්‍ර : එහෙම නම් මහත්මිය සත්‍ය ප්‍රකාශ කරන බවට දිවුරුම් දීලා මෙම ඉල්ලුම්කරු ඩයස් මහත්මයා 1990.06.01 වන දින සිට 5(ii) කාර්මික නිලධාරී ලෙස පත් කලා කියලා කියනවා නම් එය අසත්‍යයක් නේද?

පි : වැරදීමක් වෙලා තියෙන්නේ

ප්‍ර : එය වැරදි ප්‍රකාශයක් නේද?

පි : ඔව්

ප්‍ර : මේ ඉල්ලුම්කාර ඩයස් මහත්මයාව 5(i) කාර්මික නිලධාරී තනතුරට පත්කළේ කවදාද කියලා නිල වශයෙන්?

පි : 2007.01.01

ප්‍ර : එය ස්ථිරද?

පි : ඔව්

ප්‍ර : එය සත්‍යයක් නම් සාක්ෂිකාරිය ඔබගේ දිවුරුම් ප්‍රකාශයේ මෙම ඉල්ලුම්කාර ඩයස් මහත්මයාව 5(i) කාර්මික නිළධාරි තනතුරට 1992.06.01 වන දින සිට පත් කළා කියලා කිව්වොත් එය අසත්‍යයක් නේද?

පි : එහෙම් තිබෙනවා නම් වැරදියි (2022.03.22 පිටු 6-7)

ප්‍ර : පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කාර ඩයස් මහත්මයාට 4 වන ශ්‍රේණියේ ඉංජිනේරු ධූරය ලබා දුන්නේ කවදා සිටද කියලා නිළ වශයෙන්

පි : 2013.10.01 වන දින

ප්‍ර : එය සත්‍යයක් නම් ඉල්ලුම්කාර ඩයස් මහත්මයාව 4 වන ශ්‍රේණියේ ඉංජිනේරු ධූරයට 1997.06.01 වන දින පත්කලා කියලා ඔබගේ දිවුරුම් ප්‍රකාශයේ කියලා තිබෙනවා නම් එයත් සාවද්‍යයි නේද?

පි : ඔව් (2022.03.22 පිටුව 8)

ඉදිරිපත් වී ඇති යොමුවේ ආරාවුලට අදාළ වන්නේ 2003 වසරේ බලාත්මක වූ බඳවා ගැනීම් පටිපාටියට වන අතර මෙම වග උත්තරකාර සාක්ෂිකාරිය වන ආයතනයේ ප්‍රධානියා වන සාමාන්‍යාධිකාරිවරයා මෙම බඳවා ගැනීම් පටිපාටි ගැන දැනුවත් නොමැති බවට සෘජුවම ප්‍රකාශ නොකළ නමුත් ඇය ප්‍රකාශ කළේ 2013-2015 බඳවා ගැනීම් සම්බන්ධව තමා දැනුවත් බවය. එය මෙසේ තහවුරු කර ඇත.

ප්‍ර : දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමත බඳවා ගැනීම් පටිපාටියක් තිබෙනවාද?

පි : තිබෙනවා

ප්‍ර : සාමාන්‍යාධිකාරී වශයෙන් කිනම් වර්ෂවල අනුමත බඳවා ගැනීම් පටිපාටි ගැනද ඔබ දැනුවත් වෙලා ඉන්නේ?

පි : 2013 සහ 2015 අනුමත බඳවා ගැනීම් පටිපාටින් සම්බන්ධව තමයි මම දැනුවත් වෙලා ඉන්නේ

ඉහත සාක්ෂි සටහන් පිළිබඳවද මාගේ අවධානය යොමු කරන ලදී.

මේ අනුව වගඋත්තරකාර පාර්ශ්වය කාලයට අදාළ වන බඳවා ගැනීම් පටිපාටිය ගැන අවබෝධයකින් තොරව තමාගේ දිවුරුම් ප්‍රකාශ මූලික සාක්ෂිය දී ඇති බැව් නීතිය ඉදිරියේ හබ කිරීමකින් තොරව පිළිගත යුතුව ඇත.

ඊට අමතරව මෙම වග උත්තරකරුගේ සාක්ෂිකාරිය ඉල්ලුම්කරුගේ දිවුරුම් ප්‍රකාශයේ කරුණු වලට තම පාර්ශ්වය විසින් 21(1) නියෝග සංග්‍රහයේ ප්‍රකාර ගරු අධිකරණයට ගොනු කරන ලද පළමු ප්‍රකාශයේ කරුණු ද ඉල්ලුම්කරුගේ සාක්ෂියක් ලෙස පිළිගන්නා මෙන් ඉල්ලා ඇත. ඒ අනුව එකී මූලික ප්‍රකාශය මගිනුත් මෙම සාක්ෂිකාරියගේ සාක්ෂි මගිනුත් ඉල්ලුම්කරුව මාර්ග සංවර්ධන අධිකාරියට බඳවා ගැනීමට අදාළ කරුණු දිගින් දිගටම දැනුවත් බවකින් යුක්තව ප්‍රකාශ කර සිටියත් වගඋත්තරකාර පාර්ශ්වය 2023.01.05 දින නැවත ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් තහවුරු කර සිටියේ මාර්ග සංවර්ධන අධිකාරිය ලබා දී ඇති පත්වීම් ගැන තමාට දැනුමක් නැති බව ප්‍රකාශ කර ඇත.

ඒ අනුව වගඋත්තරකරුගේ ස්ථාවරය ප්‍රතිබන්ධනය වන අතර, මෙම සාක්ෂිකාරියගේ ස්ථාවරයද ප්‍රතිබන්ධනය වන අතර තමාගේ දිවුරුම් ප්‍රකාශයේ වැරදි කරුණු හා සාවද්‍ය ප්‍රකාශ කර ඇති බවට මා ඉදිරියේම පිළිගෙන ඇති තත්ත්වය මත වගඋත්තරකරුගේ සාක්ෂිකාරියගේ සාක්ෂිය නීතිය ඉදිරියේ විශ්වාසය තැබිය නොහැකි සාක්ෂිමය ගණයට අයත් වන සාක්ෂියක් මත බැහැර කල යුතු සාක්ෂියක් බවටත් එහි සාක්ෂිමය අගයක් නොමැති බවත් හබ කිරීමකින් තොරව පිළිගත යුතුව ඇත.

මේ අනුව ඊළඟට සලකා බැලිය යුත්තේ යොමුවට අදාළ ආරාවුල වෙනුවෙන් මෙහි ඉදිරිපත් වී ඇති ලිඛිත හා වාචික සාක්ෂි අනුව කිනම් පාර්ශ්වයක් විසින් ඉදිරිපත් කරන ස්ථාවරය මෙම බේරුම්කරණය ඉදිරියේ ඔප්පු වී ඇතිද? (Proved) යන්න විනිශ්චයාධිකාරය වෙත ඉදිරිපත්ව ඇති සාක්ෂි මත තීරණය කිරීම තුළ කිනම් පාර්ශ්වයේ ස්ථාවරය වඩා විය හැකි (more probable) ස්ථාවරය ලෙසට මෙම බේරුම්කරණය ඉදිරියේ තහවුරු වී ඇතිද යන්න සලකා බැලීම සාධාරණ යුක්ති මූලධර්ම වලට අනුගතද යන්න පහත සඳහන් උපරිමාධිකරණ වාර්තාගත නඩු තීන්දු අනුව නැවත නැවතත් සලකා බැලීම වැදගත් වේ.

**Vijaya Textiles Ltd and General Secretary Vs. National Employees Union 73 NLR 405 at page 407, 4408**

The president has to make a just and equitable order, In making such order he has to keep in mind the fact of each case.

"I should think that in the circumstances although a Labour Tribunal is not bounded the Evidence Ordinance, section 3 of this Evidence would be a safe guide to enable it to make a just and equiutable order. What is essential is it to exercise the wisdom of a prudent man and section 3 provides for this".

**Hemas (Estates) Ltd and another Vs. Ceylon Workers Congress 76 NLR 59**

In proceedings before a Labour Tribunal relating to a dispute between a workman and his employer. It is open to the president to accept the more probable version and to decide the case on a balance or probability.

මා වෙත ඉදිරිපත් වූ සියළු සාක්ෂි විශ්ලේෂණාත්මකව විශ්ලේෂණය කිරීමේදී වගඋත්තරකරුගේ දෙයාකාර සැළකිල්ල මත ඉල්ලුම්කරුව නියමිත කාලවකවානු තුළ නියමිත ශ්‍රේණි හා තනතුරු ලබා නොදීම හා අදාළ නියමිත වැටුප් තලවල නොපිහිටුවීම මත අසාධාරණයක් සිදුවී ඇති තත්ත්වය අනුව ඉල්ලුම්කරුට සිදුවී ඇති මූල්‍ය හානිය (Actual Financial Loss) අවම කරගනු වස් (To mitigate the loss) ඉදිරිපත් වී ඇති සාක්ෂි සමබර කිරීමේදී බැස ගත හැකි නිගමනය කුමක් වන්නේද යන්න ගරු උගත් අධිකරණයට ඇති වැදගත්ම ප්‍රශ්නය වේ. ඒ සම්බන්ධයෙන් :-

**Ceylon Estate Staff Vs Suptea of Maramare estate**

The president of the Labour tribunal should make a proper evaluation and consideration of the totative of the evidence before arriving a conclusion.

“වැදගත්ය”. එසේමය :-

**Lewis Brown Co, Ltd., Vs Percy Nelson Christoper Periyapperuma 81 CLW 30**

That the orderof the tribunal is not just and consideration of all relevant evidence adduced at the inquiry හි දක්වා ඇති පරිදි ප්‍රදානය ලබා දීමේදී සියළු සාක්ෂි සළකා බැලීම අනිවාර්ය වේ යන්නය.

ඒ අනුව මෙම සෑම විටම සාධාරණ හා යුක්ති සහගත තීරණයක් ලබා දීමට බැදී සිටින කාර්මික අධිකරණයේදී හා බේරුම්කරණයේදී

**Vijaya Textile Limited and General Secretary Vs. Employees Union 73 NLR 405 Hemas (Estate) Limited and another Vs. Ceylon Workers Congress 76 NL 59**

වැනි නඩු වලදී පිළිගෙන ඇති පරිදි මෙහි දෙවන පාර්ශ්වයේ සේවා යෝජකගේ ක්‍රියා කලාපය සාධාරණ හා යුක්ති සහගත නොවන බවට උගත් ඔබ තුමා තීරණය කරනවා ඇත. ඒ මත මෙම ඉල්ලුම්කරුට අහිමි කර ඇති ජ්‍යෙෂ්ඨත්වය අහිමි කිරීමද බරපතල අසාධාරණය ගැනද ගරු අධිකරණයේ අවධානය යොමු කළ යුතුව ඇත.

මෙම ඉල්ලුම්කරුට හිමි විය යුතු යොමුවට අදාළ තනතුරු වලට හිමි වැටුප් අහිමි කිරීම හා එහි (Wrong fullness) මත සිදුව ඇති සත්‍ය මූල්‍ය හානිය ගණනය කිරීමේදී ඉල්ලුම්කරුවාගේ අනාගත පාඩුව (future loss) අහිමි වන විශ්‍රාමික වරප්‍රසාද (loss of retrial benefits) සම්බන්ධවද සලකා බැලිය යුතු වන අතර, ඍජුවම ඉල්ලුම්කරුට සිදුව ඇති සත්‍ය මූල්‍ය හානිය ගණනය කිරීමේදී ඔහුට සිදුව ඇති අත්‍යාසන්න සත්‍ය මූල්‍ය හානිය සැලකීමේදී එනම්.

Jayasuriya Vs. Sri Lanka State Plantation Corporation (1995) 2 SLLR 379 at page 407

Associated Newspapers of Ceylon Vs. Jayasimhe (1982) 2 SLLR 595

SPC Vs. Jayasuriya (1995) 2 SLLR At page 411

මෙහි උපරිමාධිකරණ වාර්තාගත නඩු තීන්දු මගින් ලබා දී ඇති නිර්නායකයන්ද සැලකිල්ලට ගෙන, මේ වන විට ඉල්ලුම්කරු වයස සම්පූර්ණ වීම මත විශ්‍රාම ගොස් ඇති තත්ත්වයට සැළකිල්ලට ගෙන දීර්ඝ කාලයක්ම මෙම වගඋත්තරකරුගේ අනීතික ක්‍රියාකලාපය මත ඉල්ලුම්කරුට දැරීමට සිදු වූ අපහසුතාවයන්ද සැලකිල්ලට ගනිමින් මේ සමඟ ගොනු කරන ‘Y’ දරන වාර්තාව මගින් ගණනය කර ඇති ඒ ඒ ශ්‍රේණි හා තනතුරු වලට අදාළ හිඟ වැටුප් හා දීමනා ගෙවන ලෙසට සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් ඉල්ලුම්කරුට ලබා දෙන ලෙස ඉල්ලුම්කරු වෙනුවෙන් ඉතා යටහත් පහත් භාවයෙන් අයැද සිටි.

වගඋත්තරකාර පාර්ශ්වයෙන් ඉදිරිපත් වූ කරුණු සළකා බැලීමේදී මෙසේ ද ඉදිරිපත් කර ඇත.

1. කරුණු එසේ තිබියදී මෙම විනිශ්වයාධිකරණයේදී අනාවරණය වූයේ කම්කරු කොමසාරිස්වරයා ඉදිරියේ වර්ෂ 2013 වන විට වගඋත්තරකාර දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කම්කරු කොමසාරිස්වරයාට කරනු ලැබූ යෝජනාවක් මත ඉල්ලුම්කරුට පෙරදාතම කරනු ලැබූ උසස්වීම් ලබා දී සහ එයට අනුව හිඟ වැටුප් ද සකසන ලද අතර වඩාත් පුදුම සහගත කරුණ වනුයේ ඉල්ලුම්කරු එකී උසස්වීම් සහ එයට අදාළ හිඟ වැටුප්ද ලබාගෙන නැවත මෙම අත්තනෝමතික අනීතික ඉල්ලීම කරනු ලැබීමය.

2. කරුණු එසේ තිබියදී මෙම විනිශ්වයාධිකරණයේදී අනාවරණය වූයේ කම්කරු කොමසාරිස්වරයා ඉදිරියේ වර්ෂ 2013 වන විට වගඋත්තරකාර දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කම්කරු කොමසාරිස්වරයාට කරනු ලැබූ යෝජනාවක් මත ඉල්ලුම්කරුට පෙරදාතම කරනු ලැබූ උසස්වීම් ලබා දී සහ එයට අනුව හිඟ වැටුප්ද සකසන ලද අතර වඩාත් පුදුම සහගත කරුණ වනුයේ ඉල්ලුම්කරු එකී උසස්වීම් සහ එයට අදාළ හිඟ වැටුප්ද ලබාගෙන නැවත මෙම අත්තනෝමතික අනීතික ඉල්ලීම් කරනු ලැබ ඇති බව වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත.

3. මෙම විනිශ්චය සභාවට ගෞරවයෙන් කියා සිටින්නේ යමකු පෙරදාතම කරනු ලැබූ උසස්වීම් පිළිගෙන හිඟ වැටුප්ද ලබා ගත්තාය යනු එකී උසස්වීම් නීත්‍යානුකූලව පිළිගත් බවයි.

4. ගරු විනිශ්වයාධිකරණයෙන් ගෞරවයෙන් අසනු ලබන කරුණ වනුයේ 1993 කාර්මික නිළධාරි 6 වන ශ්‍රේණියට බඳවා ගත් තැනැත්තෙකුට වසර හයකින් ඉංජිනේරුවරයෙකු වීමට කිසිදු සුදුසුකමක් නොමැතිව උපාධියක් හෝ නොමැතිව පළපුරුද්දක් හෝ නොමැතිව හුදෙක් රෙගුලාසි පටිපාටි සියල්ල උල්ලංඝණය කොට කෙසේ හෝ පෙරදාතම කොට ලබා ගත් ලිපි වලින් පමණක් ඉංජිනේරුවරයෙකු වීම පිළිගත හැකිද යන්න වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත.

සාමාන්‍යයෙන් වසර 13 ක් සේවයේ සිටිය යුතු අයෙකුට වසර 6 කින් ඉංජිනේරු 4 පත්වීමක් ලබා දී සියළු නීති රීතීන් රෙගුලාසීන් උල්ලංඝණය කළ හැකිද යන්නත් වේ.

5. තවදුරටත් ගරු බේරුම්කරණ අධිකරණයට ගෞරවයෙන් කියා සිටින්නේ මෙම විනිශ්වයාධිකරණයේදී වැඩිදුරටත් සනාථ වූයේ,

1) ඉල්ලුම්කරුගේ මුල් පත්වීමම නිසියාකාරව ලබා නොමැති බවත් සේවයට බැඳීමට අවශ්‍ය මූලික සුදුසුකම් සපුරලීමෙන් තොරව සේවයට බැඳී ඇති බවත්

2) 1987.05.04 දින සුදුසුකම්ද සපුරාලීමකින් තොරව කාර්මික නිළධාරී 9 ශ්‍රේණියට මධ්‍යම රජය යටතේ සේවයට බැඳුණු ඉල්ලුම්කරුගේ සේවය 1988.06.01 දින ස්ථිර කර ඇති බවත් 1990.01.01 දින දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අන්තර්ග්‍රහණය කිරීම වන විට සියළු රෙගුලාසි වලට පටහැනිව ශ්‍රේණි 3 ක් පසු කරමින් කාර්මික නිළධාරී 6 ශ්‍රේණියට පත්ව ඇති බවත්,

3) ඒ හේතුවෙන්ම දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය කාර්මික නිලධාරී 6 ශ්‍රේණිය යටතේ පත්වීම් ලැබුවද දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ බඳවා ගැනීම් පටිපාටිය අනුව නිසි සුදුසුකම් සපුරා නොමැති බවත්

4) ඉල්ලුම්කරු විසින් ලබා ගෙන ඇති සියළු කාර්මික නිලධාරි සහ ඉංජිනේරු තනතුරු රෙගුලාසි අනුව ලබා ගෙන නොමැති බවත් විවිධ බලපෑම් සහ ඉල්ලීම් මඟින් රෙගුලායි උල්ලංඝණය කරමින් පසුදාතම කරමින් ලිපි ලබාගෙන ඇති බවත්,

5) රෙගුලාසි අනුව ඉල්ලුම්කරු විසින් ඉල්ලා ඇති තනතුර සඳහා B.Sc. ඉංජිනේරු උපාධිය අවශ්‍ය බවත්,

6) ඉල්ලුම්කරු විසින් කාර්මික නිළධාරි 5(II) ශ්‍රේණිය, 5(1) ශ්‍රේණිය, ඉංජිනේරු 4 යන ශ්‍රේණි වල සිටිය යුතු අවම කාලයවත් සේවයේ යෙදී නොසිටි බවත් ඉල්ලුම්කරු සිදු කර ඇති ඉල්ලීම් ලබා දුනහොත් සියළු රෙගුලාසි උල්ලංඝණය වන බවත් එමඟින් ඉල්ලුම්කරු සමහර තනතුරු වල සේවයේ යෙදී සිටීමවත් සිදු නොකර උසස්වීම් ලබා ගන්නා බවත්,

7) ඉල්ලුම්කරුට ලබා දී ඇති සියළු පත්වීම් රෙගුලාසි උල්ලංඝණය කරමින් පෙරදාතම කර ඇති බවත්

8) ඒ අනුවම එකී පත්වීම් ඉල්ලුම්කරු විසින් විරෝධතාවයකින් තොරව පිළිගෙන ඇති බවත්

9) ඉල්ලුම්කරුට දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ පත්වීම ලබා දීමේදී ඊට පෙර මධ්‍යම රජයේ සේවය කරන ලද සේවා කාලය පරිවාස කාලය සඳහා පමණක් වලංගු වන බව පත්වීම් ලිපියේ ඇති බවත්,

10) 1993 වසරේ බඳවා ගැනීම් පටිපාටිය බලපැවැත්වූයේ 2003 වසර දක්වා පමණක් බවත්

11) ඉල්ලුම්කරු XI සම්බන්ධයෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) විසින් අනුමත 12 සහ 13 මඟින් පැහැදිලි කර දන්වා ඇති බවත්

12) 1993 වසරේ බඳවා ගත්තා නම් කාර්මික නිළධාරී 5 (I) ට පැමිණිය යුත්තේ 1998 බවත් කාර්මික නිළධාරී 5(ll) සඳහා 1998 වසරේ සිට තවත් වසර 3 ක් ආ යුතු බවත් ඉංජිනේරු 4 ශ්‍රේණියට පත්වීමට තවත් වසර 6 ක් සිටිය යුතු බවත්,

13) කිසිදු අවස්ථාවක ඉල්ලුම්කරු පෙරදාතම කරන ලද උසස්වීම් ප්‍රතික්ෂේප කරමින් හෝ හිඟ වැටුප් ලබා ගැනීම ප්‍රතික්ෂේප කරමින් කටයුතු නොකළ බවත් හා ඒ බව කිසිදු ආකාරයකින් දන්වා නොමැති බවත්,

14) ඉල්ලුම්කරුට නීත්‍යානුකූලව ඉංජිනේරු 4 ශ්‍රේණියට උසස්වීම් ලැබිය යුත්තේ 2006 වසරේ බවත් ඒ බව වගඋත්තරකාර ආයතනය ඉල්ලුම්කරුට දිගින් දිගටම දන්වා යවා ඇති බවත්

15) කාල සීමාවක් වෙනස් කොට ඉංජිනේරු 4 ශ්‍රේණියට පත් කිරීමට අවශ්‍ය බීඑස්සී ඉංජිනේරු උපාධියක් හා පළපුරුද්ද වැනි විශේෂ සලකා බැලිය යුතු තත්ත්වයක් කිසිදු අවස්ථාවක ඉල්ලුම්කරු සම්බන්ධයෙන් නොතිබූ බවත් වේ.

6. ඒ අනුව ගරු බේරුම්කරණ අධිකරණයට ගෞරවයෙන් කියා සිටින්නේ ඉල්ලුම්කාර පාර්ශ්වයට කිසිදු ආකාරයකින් ඔහු ඉල්ලා ඇති ආකාරයේ ඉල්ලීමක් සිදු කිරීමට හෝ ස්ථාවරයක් ගැනීමට නීතිමය සහ සාක්ෂිමය බලයක් අයිතියක් නොමැති බවත් වේ.

7. තවදුරටත් ගරු බේරුම්කරණ අධිකරණයට ගෞරවයෙන් කියා සිටින්නේ විනිශ්චිත නඩු තීන්දු ගණනාවකින්ද මෙවැනි නිසි සුදුසුකම් හා සේවා කාලය සම්පූර්ණ කිරීමකින් තොරව පෙරදාතම කරමින් ලබා ගත් පත්වීම් මඟින් තවදුරටත් උසස්වීම් හා ඊට අදාළ හිඟ වැටුප් වැනි අයිතිවාසිකම් ඉල්ලීමට හැකියාවක් නොමැති බවට ශ්‍රේෂ්ඨාධිකරණය හා අනෙකුත් ඉහළ අධිකරණ මගින් ප්‍රකාශ කොට ඇති බවත් වේ. (මේ සම්බන්ධයෙන් වැදගත් වන ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුවක් වන අමුණුපුර සීලවංශ හිමි සහ තවත් අය එ. අතිරේක ලේකම්, රාජ්‍ය සේවා කොමිසම නඩුවේ පිටපතක් මා වෙත ඉදිරිපත් කර ඇත)

ඉල්ලුම්කරු විසින් ඒ2 සිට ඒ39 දක්වා ලේඛන සමඟ සිය ලිඛිත දේශන මා වෙත ඉදිරිපත් කර ඇත. වගඋත්තරකාර පාර්ශ්වයද පී1 සිට පී17 දක්වා ලේඛන සලකුණු කරමින් ලිඛිත දේශන මා වෙත ඉදිරිපත් කර ඇත.

දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි සහ විනිශ්චිත නඩු තීන්දු ගණනාවක් ඉදිරිපත් කරමින් සිය ස්ථාවරය ප්‍රකාශ කර ඇත.

එකී සියළු කරුණු සලකා බැලීමෙන් අනතුරුව මා පහත නිගමන වලට එළඹෙන ලදී.

- වගඋත්තරකාර පාර්ශ්වය අසාධාරණ ලෙස කටයුතු කර ඇති බවට ඉල්ලුම්කාර පාර්ශ්වය සාධාරණ සැකයකින් තොරව සිය නඩුව ඔප්පු කර ඇත. නිසියාකාරයට උසස්වීම් නොලැබීම හේතුකොට ගෙන ඉල්ලුම්කරු ආර්ථික වශයෙන්ද මානසික වශයෙන්ද මහත් අපහසුතාවයකට පත්ව ඇති බව ඒත්තු ගන්වා ඇත.

- වග උත්තරකාර පාර්ශ්වය සියළු දෙනාට එක හා සමාන සැලකීම මූලධර්ම වලින් බැහැරව කටයුතු කර ඇති බවට සාක්ෂි වලින් පැහැදිළි වේ.

ඒ අනුව ඉල්ලුම්කරුගේ ඉල්ලීම නීත්‍යානුකූල සහ සාධාරණ ඉල්ලීමක් බව මම තීරණය කරමි.

1990.06.01 වන දින සිට 5 (ii) කාර්මික නිළධාරී තනතුර සහ 1992.06.01 වන දින සිට 5 (i) කාර්මික නිලධාරි තනතුර ද 1997.06.01 දින සිට 4 වන ශ්‍රේණියේ ඉංජිනේරු ශ්‍රේණියද යන පදනම මත මූලික වැටුපට අනුරූපිතව හිඟ ගෙවීම් කළ යුතු බව මම තීරණය කරමි. ඉල්ලුම්කරුගේ ඉල්ලීම යුක්ති සහගත බවත් ඉල්ලුම්කරුට පහත සහන ලබා දිය යුතු බවට මම තීරණය කරමි.

- සියළුම උසස්වීම් වලට අනුකූලව වැටුප් වර්ධක ලබා ගැනීමට හිමිකම ඇත.

- සියළුම උසස්වීම් වලට අනුකූලව වැටුප් වර්ධක හා පාරිතෝෂික ලබා ගැනීමට හිමිකම ඇත

- සියළුම උසස්වීම් වලට අනුපාතිකව සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ සහ සේවක භාරකාර අරමුදලේ ප්‍රතිලාභ ලබා ගැනීමට හිමිකම ඇත.

ඉහත 1,2, 3 හි කරුණු වලට අදාළව වෙන් වෙන්ව ගණනය කිරීම් වෙනුවට සම්පූර්ණ වන්දි මුදල ලෙස රු. 6,000,000/- ක මුදලක් ඉල්ලුම්කරුට ලබා දිය යුතු බවට මම නියෝග කරමි.

මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පල වී මාස 2 ක් ඇතුළත ඉල්ලුම්කරුට ගෙවීමට හැකි පරිදි ගාල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතුය.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බව සහතික කරමි.

**නීතිඥ කේ. ඒ. ට්‍රෙවෝ ප්‍රනාන්දු**
බේරුම්කරු

2025 මැයි මස 09 වැනි දින.
බේරුම්කරණ හා කාර්මික අධිකරණ යේ දීය.

EOG 07-0284